# විසි වසරක පාසල් දිවියෙන් ඔප් නැංවුණ තාරුණ්‍යයේ පහන් ටැඹ

වත්සලා ඉෂ්ටවීර



වසර දෙකක පමණ කාල පරාසයක් තුල මෙල්බර්න් වාසී ශ්‍රී ලාංකීය සිසු දරු දැරියන්ටම අනන්‍ය වූ ශ්‍රී ලාංකීය සභ්‍යත්වයක් සොයා යමින් දේශීයත්වය රැක ගත් නැවුම් ආදි සිසු සංගමයක් බිහි කරලීමට මෙල්බර්න් වාසී තරුණ දූ දරු පිරිසක් දැඩි පරිශ්‍රමයක් දැරූහ. එකී ප්‍රයත්නය මල් ඵල ගන්වමින්, තම මව්බස ප්‍රගුණ කරගැනීමට ශක්තිමත් අත්වැලක් සැපැයූ සිංහල භාෂා පාසලටත්, එහි වර්තමාන සහ අනාගත සාඩම්බර උරුමකරුවනටත් බොහෝ දෑ ඉතිරි කර දායාද කරනු වස්, නිර්මාණය වූ රොක්ස්බර්ග් පාර්ක් සහ මිල් පාර්ක් සිංහල ආදි සිසු සංගමය බිහි වී අද වන විට වසර දෙකක් සපිරී ඇත. ගෙවී ගිය වසර දෙකක අපූර්ව මතකයන් ආවර්ජනය කරමින් නව කමිටු සමාජිකයන් පත්කර ගැනීම සඳහාත් ඔවුනොවුන් හමු වී සුහද කතාබහක යෙදීම සඳහාත් පවත්වන්නට යෙදුනු සංගමයේ වාර්ෂික මහා සභා සැසිවාරය පසුගිය දිනෙක රොක්ස්බර්ග් පාර්ක් හෝම්ස්ටෙඩ් ප්‍රජා ශාලාවේ දී ඉතා චාම් අයුරින් පවත්වන්නට යෙදුණි.

පාසලේ ආදි සිසු දූ දරුවන් සහ ඔවුනගේ උපදේශිකාව වන, විපුලි ගුණසේකර මහත්මිය විසින් සංවිධානය කරනු ලැබ තිබූ එම උත්සවයට සහභාගි වීමට මටද ආරාධනාවක් ලැබීම ගුරුවරියක් ලෙසින් මා ලද මහඟු අවස්ථාවක් යැයි මට සිතේ.

ඕස්ට්‍රේලියාව වැනි බටහිර සමාජ තලයක ජීවත් වෙමින් කුඩාකල පටන් මෙරටේ අධ්‍යාපනය ලැබුවද, ස්වකීය සාරධර්මයන් තමන්ගෙන් ගිලිහී නොයන්නට වගබලා ගනිමින්, තම මව් බසත් ඉංග්‍රීසි බසත් එකලෙස මුබරිව හසුරුවමින් එදා ඔවුන් පෙන්වූ දක්ෂතාව මෙහිලා විශේෂයෙන්ම සඳහන් කිරිම වැදගත්. එදා, සිංහල භාෂා පාසලක සෙවන මොවුනට නොලැබෙන්නට අද මේ සා විශාල අභියෝගයකට තමනට මුහුණ දීමට නොහැකිවනු ඇතැයි ඔවුහු නොබියව පැවසූහ. එසේ උරුමකරගත් ශික්ෂණය තම ජීවිතයට ලබා දුන් ආලෝකය මතු පරපුර උදෙසා නොනිවී දල්වා තබන්නට ශක්ති සම්පන්න තරුණ ජවයක් අද මේ සංගමය වටා එක් රොක් වී සිටීම කොතරම් වාසනාවක් ද ?

මීට වසර දෙකකට පෙරාතුව, හා පුරා කියා ආරම්භ වූ රොක්ස්බර්ග් පාර්ක් හා මිල් පාර්ක් ආදි සිසු සංගමයේ මංගල සභාවාරය වාර්තා කරද්දී මට හමු වූ සංගමයේ ප්‍රධාන නිලධාරින් අද වන විට වෛද්‍ය වෘත්තිය වැනි උසස් ක්ෂේත්‍රයන් හී සිටිනු දැකීම භාග්‍යයකි. සැබවින් ම එය මතු අනාගතය දෙස නෙත් යොමා සිටින ශ්‍රී ලාංකීය අපේ දූ දරුවනට මනා ආදර්ශයක් වන්නේය. ඒ මන්ද යත්, පුරාණ කාලයේ පටන් අදටත් අපි -අවවාදයට වඩා ආදර්ශය උතුම්" යැයි සලකන හෙයිනි.

මෙම මාහැඟි සත්කාරය ආරම්භ කර අවුරුදු දෙකක ඇවෑමෙන් වුවද තවමත් පාසලේ ගුරු-සිසු සබැඳියාව පෙර ලෙසම හෝ ඊටත් වැඩියෙන් රැක ගැනීමට මොවුන් අමතක කර තිබුනේ නැත. සිංහලයින්ගේ මේ උතුම් ගුණාංගය සංකේතවත් කරමින්, මෙයට විසි වසරකට පෙර ආරම්භ වූ රොක්ස්බර්ග් පාර්ක් සිංහල භාෂා පාසලේ ආරම්භයට පුරෝගාමී වූත්, පාසලේ අභිවෘද්ධිය තකා තම කාලය සහ ශ්‍රමය කැපකළා වූත්, නිරන්තරයෙන්ම දූ දරුවන්ගේ දියුණුව අගයන හිමාලී කරුණාසේන ගුරුමෑණියනට සභා ගර්භයේ දී ඔවුහු ගෞරවපූර්වකව තම හරසර පුද කළහ.

නැගී හිනිමඟට පයින් ගසා යන අවස්ථාවන් අද සමාජයේ කොතෙකුත් කතා බහට ලක් වේ. මේ හුරුපුරුද්දට වයස හෝ තරාතිරමේ සීමාවක් නැත. එවන් වූ කාල වකවානුවක හැදී වැඩෙන, තවමත් ජීවිත අද්දැකීම් වලින් පරිපූර්ණ නොවූ මේ දරුවන් සමූහය ගුරුවරුනගේ දෙපා නැමද තම භක්තිපූර්වක ප්‍රණාමය ඔවුනට පුද කිරීම මෙහිලා සිහි කරනුයේ හදපිරි සොම්නසිනි.

සාරධර්ම අභිබවා මුදල් පසුපස හඹායන නූතන සමාජයෙන් ගිලිහී යමින් පවතින සිංහල අපේකම රැකගන්නටත්, පිපෙන්නට පුල පුලා බලා සිටින මතු පරපුරට ඒ සාරධර්ම ගෙනයන්නටත් දුවේ පුතේ ඔබ දරන්නා වූ මේ අවිහිංසක උත්සාහය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යන්න මගේ පැතුමයි !


Australian Government

## People of Australia Ambassadors Program

Nominations are now open for the Australian Government's People of Australia Ambassadors Program.

As part of Australia's new multicultural policy, the Prime Minister has announced the Australian Multicultural Council will appoint up to 40 People of Australia Ambassadors.

Ambassadors will champion inclusion and provide 'grass roots' input to the Australian Multicultural Council and to government.

Ambassadors will be appointed for a 12 month period and will have key roles in annual community events and celebrations including Harmony Day on 21 March.

## Who can nominate to be a People of Australia Ambassador?

Communities or individuals are invited to nominate a person to be considered for the role of People of Australia Ambassador. Individuals can nominate themselves.

People who are nominated should have demonstrated a strong commitment to inclusion and social cohesion or may have involvement in a diverse range of community work and programs that strengthen neighbourhoods and unite all Australians.

Nominations will be considered by the Australian Multicultural Council.

## How to nominate

Go to www.amc.gov.au to access the nomination form and for more information about the People of Australia Ambassadors Program.

Nominations close on Friday 7 October 2011.